// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1958/6 - 2016 මාර්තු මස 15 වැනි අඟහරුවාදා - 2016.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තුවක්කු ආඥාපනත

#### බලපත්‍ර රහිත තුවක්කු බාරදීම සඳහා කාලසීමාවක් ප්‍රකාශයට පත් කිරීම

1920 අංක 01, 1945 අංක 12, 1947 අංක 07 දරන ආඥාපනත් හා 1955 අංක 18 හා 22, 1975 අංක 38, 1980 අංක 08, 1981 අංක 50, 1996 අංක 22 දරන පනත් වලින් සංශෝධිත (182 වන අධිකාරිය) වූ තුවක්කු ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන වන මම, බලපත්‍ර රහිත තුවක්කු රජයට බාරදීම සඳහා මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි පහත උපලේඛනයේ දැක්වෙන පරිදි කාලසීමාවක් ප්‍රකාශයට පත් කරමි.

තවද, එම කාලසීමාව තුළ බලපත්‍ර රහිත තුවක්කු බාරදෙනු ලැබූවිට බාරදුන් දිනයට පෙර එම තුවක්කුව තම බාරයේ තිබීම හෝ සන්තකයේ තිබීම හෝ පාවිච්චි කිරීම හේතුවෙන් තුවක්කු ආඥාපනතේ 22 වගන්තියට පටහැනි වූ යම් වරදක් සඳහා පවරනු ලබන යම් දඩයක් හෝ දඬුවමක් සඳහා එම තුවක්කුව බාරදුන් තැනැත්තා යටත් නොවිය යුතු බවට නියම කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ආරක්ෂක අමාත්‍ය.

2016 මාර්තු මස 01 වන දින,
කොළඹ දී ය.

##### උපලේඛනය

01. බලපත්‍ර රහිත තුවක්කු බාරදිය යුතු ස්ථාන

   i. සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකටම
   ii. සෑම ප්‍රාදේශීය ලේකම කාර්යාලයකටම
   iii. සෑම පොලිස් ස්ථානයකටම

02. කාල සීමාව

   2016 අප්‍රේල් මස 25 වන දින පෙ. ව. 9.00 සිට 2016 මැයි මස 06 වන දින ප. ව. 4.00 දක්වා

04 - 130

1A - G 23127 — 08 (2016/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*